# පස්දුන් කෝරළයේ ඉතිහාසය තර කරන බුලත්සිංහල මහ පන්සලේ ඉපැරණි බිතු සිතුවම්

කළුතර දිස්ත්‍රික්කයට අයත් පස්දුන් කෝරළය මානව ශිෂ්ටාචාරයක දිගු ඉතිහාසයකට උරුමකම් කියන ප්‍රදේශයක් බවට මේ වන විටත් පත් වී හමාර ය. එහි ප්‍රබලතම සාධකය වන්නේ වසර 37000 ක් පැරණි පාහියංගල ප්‍රාග් මානව ශිෂ්ටාචාරය යි. මේ හැර ඓතිහාසික යුගයේ දී ද අනුරපුර යුගයේ කෙසේ වෙතත් පොළොන්නරු සමයේ සිට විවිධ මානව ක්‍රියාකාරකම් සිදු වූ ප්‍රදේශයකි. කළු ගඟ හා අතුරු ගංගා ජාලයකින් සමන්විත මෙම ප්‍රදේශය තේ, රබර්, පොල්, කුරුඳු වැනි ආර්ථික වැවිලි බෝග මෙන් ම කුඹුරු ගොවිතැන ද සරුවට කෙරෙන පළාතකි. නිරන්තරව පිටාර ගලන ගංගා ජලයෙන් ද මෙම කෝරළයේ ජනතාව පීඩා නොවිඳින්නේ නොවේ.

ආගමික වශයෙන් ගත් කළ ද බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි, මුස්ලිම් ආදී භක්තිකයන් වාසය කරන පළාතකි. මෙහි වෙසෙන බෞද්ධ ජනතාවෝ දීර්ඝ කාලීන ව බෞද්ධ පරිසරයක හැදුණු වැඩුණු සාමකාමී පිරිසක් වූහ. මේ සඳහා දායකත්වය සැපයූයේ ගමේ විහාරස්ථානයයි. මෙබඳු විහාරස්ථාන අතර  බුලත්සිංහල මහපන්සලට හිමි වන්නේ ප්‍රමුඛස්ථානයකි. මෙම විහාරස්ථානය බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ බුලත්සිංහල දකුණ ග්‍රාමසේවා වසමෙහි පිහිටියේ ය. ඒ සඳහා මාර්ග කිහිපයකින්  ළඟා විය හැකි ය. හොරණ කලවැල්ලාව මාර්ගයේ ඈගල්ඔය හන්දිය පසු කොට හොරගස්හන්දියෙන් වමට හැරී මීටර් 500 ක් පමණ ගිය තැන මෙම විහාරස්ථානය හමුවේ. ඒ හැර ඉංගිරිය හල්වතුර මාර්ගයේ ඈගන්ඔය හන්දියෙන් ද අගලවත්ත හොරණ මාර්ගයේ අතුර මංසන්ධිය පසුකොට හොරගස් හන්දියෙන් දකුණට හැරී ද මෙම විහාරස්ථානයට ළඟා විය හැකි ය. අද මෙම විහාරස්ථානය දාගැබ, බෝධිය, පැරණි බුදුගෙය, නව විහාරගෙය, ධර්ම ශාලාව, ආවාස ගෙය ආදියෙන් යුතු සකලාංග සම්පූර්ණ විහාරස්ථානයකි. මෙම විහාරස්ථානයේ ආරම්භය පිළිබඳ වඩාත් නිශ්චිත තොරතුරු අද වන විට සොයාගැනීමට මදක් අපහසු වුව ද මෙහි ආරම්භය 1850 දශකයේ දී සිදු වූ බවට සාධක හමු වේ. 1856 දී පමණ නාරගල දේවමිත්ත නම් යතිවරයාණ කෙනෙක් මෙය ආරම්භ කළ බව සැළකේ. උන්වහන්සේ සමයේ දී එහි ඇති පුරාණ බුද්ධ ප්‍රතිමා ගෘහය ඉදිකරන්නට ඇතැයි සිතීමට පුළුවන. මේ සඳහා ලැබෙන ප්‍රමුඛතම සාධකය වන්නේ විහාර ගෘහයේ ප්‍රධාන පිවිසුම් දොරටුවට ඉහළින් බුදුගෙයි වැඩ අවසන් කළ වර්ෂය ලෙස බුද්ධ වර්ෂ 2410 සටහන් කොට තිබීම යි. එය ක්‍රි.ව. වලින් ගත් කළ 1867 වන්නේ ය. ඒ අනුව මේ වන විට මෙම විහාර ගෘහයේ ප්‍රතිමා සහ සිතුවම්වලට වසර 142 ක් පමණ වී ඇත.

## විහාර ගෘහයේ වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ

විහාර භූමියට ඇතුළු වන විට එහි වම්පසින් ඉදිරියෙන් ම හමුවන්නේ මෙම පුරාණ විහාර ගෘහයයි. එය ආලින්දය පිට මාලය හා ඇතුළු මාලය යන කොටස්වලින් යුක්ත වේ. නිර්මාණ ලක්ෂණ අනුව මුල් සමයේ විහාර ගෘහයට ආලින්ද කොටස නොතිබෙන්නට ඇති අතර එය පසුකාලයක දී එක් කරන්නට ඇතැයි සිතිය හැකි ය.

විහාර ගෘහයේ උස අඩි 20 ක් ද ආලින්දය ද සහිතව දිග අඩි 35 ක් පමණ වන අතර පළල අඩි 25 කි. කොට බිත්තිවලින් යුතු ආලින්දය ඔස්සේ විහාර ගෘහයෙහි ප්‍රධාන පිවිසුම් දොරටුවෙන් පිටමාලයට ඇතුළුවිය හැකි ය. එය ගිනිකොණ දිශාවට මුහුණ ලා තිබේ. එම බිත්තියට සමාන්තරව පිවිසුම් දොරටුව දෙපස ජනෙල් දෙකකි. මේ හැර ඊසාන දිශාවට ද මුහුණ ලා එම බිත්තියෙහි තවත් දොරටුවක් ඇතත් එය දැනට භාවිතා නො කෙරේ. දොර පියන යට කොටස හිරිකඩයෙන් හා අව්වෙන් මදක් විනාශ වී පවතී. මේ හැර නිරිත හා වයඹ බිත්තිවලට සම්බන්ධ ව ජනේලය බැගින් වේ. ආලින්දයේ හැර විහාර ගෘහයේ බිත්තිවල පිට පැත්තෙන් මඳක් උස කයියෝරු බැඳ ඇත. විහාර ගෘහය තුළ පිට මාලකයේ පළල අඩි 5 ක් පමණ වේ. ඇතුළු මාලයට ඇත්තේ එක් දොරටුවක් පමණි. එය ද ප්‍රධාන පිවිසුම් දොරටුවට එනම් ගිනිකොණ

දිශාවට අභිමුඛ ව පවතී. මේ හැර ඇතුළු මාලයේ ඊසාන දිග බිත්තියට සම්බන්ධ ව කුඩා ප්‍රමාණයේ ජනෙල් කවුළුවක් වේ. පිට මාලයේ ඊසාන දිග බිත්තියේ ඇති දොරටුවෙන් ලැබෙන ආලෝකය ගර්භ ඇතුළු මාලයට ලබාගැනීමේ අදහසින් මෙම ජනේලය යොදන්නට ඇත.

ගර්භ ගෘහයේ බිත්ති පොළව මට්ටමේ සිට අඩි 15 ක් පමණ ඉහළට ඔසවා ඊට එක් වහලක්ද ඉන් මඳක් පහළින් එනම් අඩි 11 ක් පමණෝදී පිට මාලය ආවරණය කිරීමට විහාර ගෘහයේ වහලය මාල් දෙකකින් යුතුව තනා ඇත. පිට මාලයේ වහලය අඩි 11 ක් උසින් පටන් ගෙන පහළට බෑවුම් ව ඇති අතර ඇතුළු මාලයේ වහලය අඩි 20 ක් පමණ උසින් පටන් ගෙන අඩි 11 අඟල් 6 ක් පමණ උස බිත්ති මතට පල 4 ක් වන සේ බෑවුම් කොට තනා ඇත. දැනට තැන තැන බිඳී ගිය උළු අතරින් විහාර ගෙය තුළට ජලය කාන්දුවෙමින් පවතී. විහාර ගෘහය තුළ බිමට සිමෙන්ති අතුරා ඇත.

මෙම විහාර ගෘහය අවස්ථා ගණනාවක දී ම ප්‍රතිසංස්කරණයට ලක්වූ බවට සාධක වේ. වහලයේ ඇතැම් ලී දඬු නැවත යොදා පිට මාලයේ පිට බිත්ති 1986 වර්ෂයේ දී පමණ සිමෙන්ති කපරාරු කළ බව ද විහාරාධිපති අමරගෙදර නන්දදේව හිමියෝ ප්‍රකාශ කළ හ.

## ප්‍රතිමා

විහාරගෙයි ඇතුළු මාලයේ පිළිම දෙකක් ඇත. එකක් හිඳි ඉරියව්වෙන් යුතු සමාධි බුද්ධ ප්‍රතිමාව වන අතර අනෙක හිටි ඉරියව්වෙන් යුතු විෂ්ණු ප්‍රතිමාවයි. බුදු පිළිමය ගිනිකොණ දිගට මුහුණලා සිටින සේ නිර්මාණය කොට තිබෙන අතර සිරස්පත සහිත ව ම එහි උස මීටර් 2 ක් පමණ වේ. දෙදණ අතර පරතරය මීටර් 1.75 ක් වේ. බුදු පිළිමයේ මුහුණ මිට දශක කීපයකට පෙර වෙනස් කළ බවද එහිදී පිළිමයේ හිස මත තිබු ලීයෙන් තැනූ සිරස් පත වෙනුවට සිමෙන්තියෙන් තැනූ සිරස්පතක්ද යෙදූ බව නන්දදේව හිමියෝ ප්‍රකාශ කළහ. ප්‍රතිමාව පරීක්‍ෂා කිරීමෙන් මෙම කරුණු වඩාත් හොඳින් පැහැදිලි වේ. බුදු පිළිමයේ සිවුර ඒකාංශව පොරවා තිබෙන අතර එය රැලි ගන්වා ඇත්තේ දිය රැල්ලක් බඳු අයුරිනි. මෙම චීවර නිරූපණ ක්‍රමය මහනුවර සම්ප්‍රදායේ ප්‍රතිමාවල බහුලව යොදන ක්‍රමයයි. දෙඅත් සමාධි මුද්‍රාවෙන් ප්‍රකාශිත අතර දෙපා වීරාසනයෙන් නිරූපිතය. ප්‍රතිමාව වටා රශ්මි මාලාවක් දක්වා තිබේ. පොදුවේ ගත් කල බුද්ධ ප්‍රතිමාවේ මහනුවර හා කොළඹ යුගයේ ප්‍රතිමා ශෛලීන් මිශ්‍රව දැක ගත හැකි වේ. විහාර ගෘහය තුළ ඇති අනෙක් ප්‍රතිමාව බුදු පිළිමයේ දකුණු පසින් නිරිත දිග බිත්තියට සම්බන්ධ කොට හිටි ඉරියව්වෙන් තනා ඇති විෂ්ණු දේව පිළිමයකි. එය සෙ.මී. 48 ක් උස හතරැස් ආසනයක් මත පිහිටුවා තිබේ. නිල් පැහැති ප්‍රතිමාවේ සම්පූර්ණ උස මීටර් 2.65 කි. රවුම් හැඩයක් ගත් මුහුණේ දෙනෙත් විවරව පවත්නා අතර නාස් පුඩු හා දෙතොල් රක්ත වර්ණයෙන් යුතු බැවින් තේජාන්විත බවක් ප්‍රකට කරයි. සිරස මත මාලක තුනකින් යුත් අලංකාර ශීර්ෂාවරණයකි. අත් සතරකින් යුතු ප්‍රතිමාවේ වම් පස අත් දෙකෙන් එකක් ඉදිරියට පා අභය මුද්‍රාව දරයි. මෙහි පහත බාහුවේ කොටසක් ප්‍රතිසංස්කරණයට ලක්ව පවතී. අනෙක් අත වැළමිට ළඟින් මදක් ඔසවා හක්ගෙඩියක් අතින් දරමින් සිටී. දකුණු පස දෙඅතින් එකක් පහත හෙළා සිටින අතර අනෙක් අතින් සළඹක් දරමින් සිටී. ප්‍රතිමාවේ උඩුකය ආභරණ වලින් සරසා තිබෙන අතර යටිකය අලංකාර ජෝතියකින්

යුක්ත වේ. ප්‍රතිමාව උත්තුංග දේහධාරී වේ. විෂ්ණු දෙවියන්ගේ වාහනය ලෙස සැලකෙන ගුරුළු රුව දේව රූපයට පසුපසින් බිත්තියේ ඇඳ දක්වා ඇත. උගේ ශරීරය රන්වන් පැහැ වන අතර කොළ පැහැති රේඛාවෙන් පිහාටු ඇඳ දක්වා ඇත. දේවරූපය වෙන්කොට දැක්වීමට සරල තොරණක් නිර්මාණය වී පවතී. ප්‍රතිමා ගෘහය තුළ දේව ප්‍රතිමාවට හිමි සීමාව වෙන් කොට දැක්වීම සඳහා මෙම උපක්‍රමය භාවිත කරන්නට ඇත. ප්‍රතිමාවේ නිර්මාණ ලක්ෂණ අනුව අති දක්ෂ ප්‍රතිමා ශිල්පියෙකුගේ කාර්යයක් බව පෙනී යන අතර මෙය ප්‍රබල ප්‍රතිසංස්කරණයට ලක් නොවී මුලු නිර්මාණ ලක්ෂණ වලින් තවමත් පැවතීම සැලකිල්ලට ලක්විය යුත්තකි.

## මකර තොරණ

මෙය පිට මාලයෙන් ඇතුළු මාලයට හෙවත් බුදු පිළිමය සහිත ගෘහයට ඇතුළු වන ප්‍රධාන දොරටුවට සම්බන්ධව ඉදිකොට ඇත. විහාර ගෘහයේ ඉදිකිරීම සහිත දින සටහන් කොට ඇත්තේ එහිය. දොරටුව දෙපස ශක්තිමත් පුරුෂයින් දෙදෙනෙකු විසින් ඔසවා ගෙන සිටින කුළුණක් මත පාද පිහිටුවා මුහුණ ලා සිටින මකරුන් දෙදෙනෙකි. ඔවුන්ගේ මුඛය තුළ ඉහළින් නිමවා ඇති කිහිබි මුඛයෙන් නික්මෙන මල්වැලක් ගිලී පවතී. කිහිබි මුඛය දෙපසින් මකරුන්ගේ හිස හා වාලධිය මත පුරුෂයින් දෙදෙනෙකු වශයෙන් සිව්දෙනෙකු නැග සිටිති. මින් දෙදෙනෙක් අත චාමර දක්නට ලැබේ. මකර තොරණ දෙකෙළවර විශාල ප්‍රමාණයේ ආරක්ෂක රූප දෙකකි. මොවුන්ගේ එක් අතක් ඉගටියෙන් රඳවා සිටින අතර අනෙක් අත ඉහළට ඔසවා මල් පොකුරක් දරමින් සිටී. මකර තොරණ සම්බන්ධව කිසිදු රූපයක ආයුධ දක්නට නොලැබීම විශේෂ ලක්ෂණයකි. සමස්තයක් ලෙස ගත් කල මකර තොරණ ඉතා කලාත්මකය. එසේ වුවද එහි ඇතැම් කොටස් විනාශ වී යැම හේතුවෙන් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් එම කොටස් ප්‍රතිසංස්කරණය කොට ඇත.

## බිතු සිතුවම්

ඇතුළු මාලයේ සිවිලිම, එම බිත්ති වල ඇතුළු හා පිට බිත්ති මුහුණත් මත පමණක් සිතුවම් වේ.

## සිවිලිමේ සිතුවම්

ඇතුළු මාලයේ කෙටි හරස් අතට බාල්ක 5 ක් යොදා එහි අතුරන ලද ලෑලි මත සිතුවම් ඇඳ තිබේ. එය බිම සිට මීටර් 3.45 ක් ඉහළින් සකසා ඇත. සිවිලිමෙහි මැද කොටසේ වියනක් මෙන් නෙළුම් මල් මෝස්තරයක් ඇඳ ඇත. ඊට මල් 80 ක් ඇතුළත්ය. ඇතැම් විට 80 මහා ශ්‍රාවකයන් සංකේතාත්මකව ඉදිරිපත් කිරීම සඳහා මෙම නෙළුම් මල් භාවිත කළේ දැයි සිතිය

හැකි ය. සිවිලිම අයින් තිරුවෙහි මිදිවැල් මෝස්තරයකි. එය මිදි පොකුරු, පත්‍ර, හා පහුරු වලින් සමන්විත වේ. මෙම වියන්තලය සඳහා කහ, රතු, නිල්, කොළ හා කළු යන වර්ණයන් භාවිතා කොට ගනිමින් ඉතා කලාත්මක ලෙස මෙම සිතුවම් චිත්‍රණය කොට ඇත.

## ඇතුළුමාලයේ ඇතුළු බිත්තියේ සිතුවම්

ඇතුළු මාලයේ බිත්ති හතරෙහි සිතුවම් වේ. මෙයින් බුදුපිළිමය සහිත වයඹ දිග බිත්තිය ප්‍රතිමාවෙන් හා රශ්මි මාලාවෙන් විශාල ඉඩ ප්‍රමාණයක් ඇසිරි තිබෙන අතර රැස් වළල්ල දෙපස ඉහළින් ඇති පටු ඉඩෙහි ඉර හා සඳ රූපගත කොට ඇත. ඊට සමාන්තර ව පහත මුළු දෙකෙහි හිඩැස සරල මල් වැලකින් සරසා ඇත. පසුබිම රතු පැහැයෙන් යුතු වේ. ඇතුළු මාලයේ සිතුවම් අතර සත්සතිය, ශ්‍රාවක රූප, දේව රූප හා සැරසිලි මෝස්තර කීපයක් වේ,

## සත් සතිය

මෙය ප්‍රතිමාවේ දකුණු පස, වම්පස හා ප්‍රතිමාවට ඉදිරි බිත්ති 3 හිම විහිදෙන සේ චිත්‍රණය කොට ඇත. චිත්‍ර තීරුවෙහි පළල මීටර් එකක් පමණ වේ. ප්‍රතිමාවේ දකුණු පස බිත්තියෙහි ඇඳ ඇත්තේ සත් සතියට අදාළ සිද්ධීන්ගෙන් පළමු හා දෙවැන්නයි. ඒ ඒ සති අනුපිළිවෙළින් අංකනයෙන් හා වචනවලින් ලියා දක්වා තිබීම ඒ ඒ සිද්ධීන් වඩාත් නිවැරදි ව හඳුනා ගැනීමට ඉවහල් වේ. පළමු සතිය දැක්වෙන රූපයෙහි බුදුන් වහන්සේ සමාධි මුද්‍රාවෙන් යුතු ව බෝරුකක් මුල වැඩ සිටින අතර බෝධිය දෙපස විවිධ වර්ගවලට අයත් ආයුධ 30 ක් පමණ ඇඳ දක්වා ඇත. මෙම ආයුධ අතර තෝමර, කඩු, දුනු, කෙටේරි, හෙල්ල, ත්‍රිශූලය, හෙණ්ඩුව, කැත්ත, දෑකැත්ත, වෑය, පොරව, බණ්ඩිකියත (හරස් කියත) ආදිය දැකගත හැකිය, මෙය මාර පරාජය කරන අවස්ථාවක් සේ සැලකිය හැකිය. දෙවන සතිය නිරූපණය කරන සිතුවමෙහි අනිමිස ලෝචන පූජාව දක්වයි. බුදුන් වහන්සේ හිටි ඉරියව්වෙන් යුතු ව බෝධිය දෙස බලා සිටින අතර උන්වහන්සේගේ දකුණු අත විතර්ක මුද්‍රාවෙන් හා වම් අත පහත හෙළා සිටී. බෝධි වෘක්ෂය හා බුදුන් වහන්සේ අතර හිඩැස පිරවීමට මල් වැලක් යොදා ඇත. තුන හතර සහ පස්වෙනි සති අනුපිළිවෙළින් බුද්ධ ප්‍රතිමා වම්පස බිත්තියෙහි නිරූපිත ය. රුවන් සක්මන නිරූපණය කරන 3 වන සතිය දක්වන සිතුවමෙහි බුදුන් වහන්සේ බංකුවකට සමාන වස්තුවක් මත ඔබ මොබ සක්මන් කරති. එය නිරූපණය කොට ඇත්තේ උක්ත වස්තුවෙහි දෙකළවර බුදු රූප දෙකක් ඇඳ දැක්වීමෙනි. මෙම රූප දෙක වෙන්කොට දැක්වීම සඳහා මැදින් පහතට එල්ලෙන තිර රෙද්දක් දක්වා ඇත. එම තිරය යමෙකු විසින් හකුලුවා ගෙන සිටින ආකාරය දැක්වීමට අත් දෙකක් පමණක් පෙන්නුම් කොට ඇත. ඉන් නිරූපණය කෙරෙන්නේ කවරක් දැයි පැහැදිලි නැත. මෙහි ඇති තවත් විශේෂ ලක්ෂණයක් වන්නේ බුද්ධ රූප දෙකෙහි බ්‍යාමප්‍රභා රශ්මි මාලාව දක්වා තිබීමයි. බුදුන් වහන්සේගේ රශ්මි මාලාව ඇති වන්නේ සිව්වන සතියෙහි රතනාඝරය තුළ හිඳිමින් ධර්මය මෙනෙහි කිරීමේ ප්‍රතිඵලයක් ලෙසිනි. 3 වන සතියේ දී එය නිරූපණය කළ ශිල්පියාගේ

නොදැනුවත් කමින් ද නැතහොත්වෙනත් උවමනාවකටදැයි කීම අපහසු ය. සිව්වනසතිය නිරූපණය කරන රූප බණ්ඩයෙහි බුදුන් වහන්සේ මාල දෙකකින් යුතු අලංකාර මන්දිරයක් තුළ හිඳි ඉරියව්වෙන් හිදිති. ගොඩනැගිල්ලේ එක් පසෙක ආලින්දයක් ද වේ. බුද්ධ රූපය දෙපස ගොඩනැගිල්ල තුළ ගෝලෝව නම් වීදුරු ලාම්පු දෙකක් එල්ලා තිබේ. මේ හැර ගොඩනැගිල්ලේ වහලය දෙකළවරෙහි අගුවේ ඝණ්ඩා දෙකක් එල්ලා ඇත. ඉන් අනතුරුව චිත්‍ර බණ්ඩයේ පස්වැනි සතිය දැක්වෙන අජපල් නුගරුක මුල ඩැඩ හිඳින බුදුන් හහන්සේ නිරූපණය කරයි. උන්වහන්සේ පිට දී හිඳින නුග වෘක්ෂයෙහි ඉහළ අතු වල සිට ඇදී එන මුල් කීපයක් බිමට සවි වී තිබේ. මෙය වෘක්ෂයේ ඇති අනන්‍යතාවය නිරූපණය කිරීමට ගත් උපක්‍රමයක් ලෙස දැක්විය හැකි ය. බුද්ධ රූපයේ රශ්මිමාලා ඇඳ ඇත. හයවැනි සතිය පස්වෙනි සතියෙන් වෙන් කොට දැක්වීමට ගසක් භාවිත කොට ඇත. හයවැනි හා හත්වැනි සතිවලට අදාල අවස්ථා දෙක ඊළග බිත්තියේ හෙවත් ඇතුළුමාලයේ පිවිසෙන දොරටුවට ඉහළින් වූ බිත්ති තලයේ ඇඳ දක්වයි. හයවැනි සතියේ දී බුදුන්වහන්සේ මුචලින්ද නාග දරණයෙහි වැඩ හිඳින ආකාරය නිරූපණය කරයි. නාගයාගේ පෙණ ගොබය දක්වා ඇත්තේ බුද්ධ රූපයේ දකුණු පසින් ඉහළට එසවෙන අයුරිනි. නාග රූපය අතිශය කලාත්මක ය. සත්වන සතිය හයවන සතියෙන් වෙන්කොට දැක්වීමට ද ගසක් යොදා ඇත. සත්වන සතියෙන් රාජායතනය නිරූපණය කරයි. එනම් කිරිපළු ගසක් යට වැඩ හිඳින බුදුන්ට උන්වහන්සේගේ වම්පසින් තලස්සු-හල්ලුක යන වෙළඳ දෙබෑයන් විළඳ පිළිගැන්වීමේ අදහසින් පාත්‍රයක් අතින් දරමින් සිටගෙන සිටී. ඔවුන්ගේ හිසට ඉහළින් අහසෙහි සතරවරම් දෙවිවරු පාත්‍ර 4 ක් දරමින් සිටී. බුදුන් වහන්සේ ඉදිරිපිට ඇති කනප්පුවක් මත පාත්‍ර හතරක් එකිනෙක මක තබා ඇත. ඒවා වර්ණ හතරකින් යුක්ත වේ. මෙම පාත්‍ර හතර සතරවරම් දෙවිවරුන් විසින් පිළිගන්වන ලද ඒවා වන්නේය. මෙම චිත්‍රයෙන් සත්සති නිරූපණය අවසන වේ.

## ශ්‍රාවක රූපය

විහාර ගෘහය තුළ හිටි ඉරියව්වෙන් යුතු ශ්‍රාවක රූප 20 ක් ඇඳ දක්වා ඇත. බුද්ධ ප්‍රතිමා වම්, දකුණු හා ඉදිරිපස යන බිත්ති 3 හි මෙම ශ්‍රාවක රූප වේ. බුද්ධ ප්‍රතිමාව දෙපස සෙ.මී. 120 ක් තරම් උසට ශ්‍රාවක රූප 4 ක් ඇඳ තිබෙන අතර ඉතිරි ඒවා සෙ.මී. 80 ක් තරම් උසට තීරු දෙක බැගින් ද ඇඳ තිබේ. මුලින් විස්තර කළ විශාල ප්‍රමාණයේ ශ්‍රාවක රූප 4 න් 2 ක් සැරියුත් හා මුගලන් රහතන් වහන්සේලාගේ බව ශරීර වර්ණවලින් හඳුනාගත හැකි ය. එහෙත් අනෙක් රූප දෙක කවුරුන්ගේ දැයි පැහැදිලිව කිව නොහැකි වුවත් ඇතැම් විට ආනන්ද හා මහා කාශ්‍යප තෙරවරුන් වීමට ඉඩකඩ ඇත. උන්වහන්සේලා සිව් නම ම බුදුන් වහන්සේ දෙසට නමස්කාර කරමින් සිටිති. කුඩාවට ඇඳි අනෙක් ශ්‍රමණ රූප මලක් බැගින් අතින් ගෙන බුදුන් වහන්සේ දෙසට හැරී සිටියි.

## දිව්‍ය රූප

බුද්ධ රූපයට වම් පස බිත්ති තලයේ ඇති ජනේල කවුළුවෙන් අනතුරු ව ඇති බිත්ති කෙළවර ඉඩෙහි සෙ.මී.192 ක් පමණ උසට සමන් දෙවියන්ගේ රුවක් චිත්‍රගත කොට ඇත. එහි රවුම් හැඩයක් ගන්නා මුහුණ බෙහෙවින් ම ශෝභාමත් ය. හිසෙහි කේතුකාකාර ඔටුන්නක් ඇඳ දක්වයි. උඩුකය ආභරණවලින් සරසා ඇත. යටිකය ජෝතියකින් සරසා ඇත. දේව රූපයේ දකුණු අතින් ඊතලයක් හා වම් අතින් දුන්නක් හෝ ඊට සමාන වෙනත් උපකරණයක් දරමින් සිටී. රූපයට පිටුපසින් දණ හිස පමණ වන තෙක් උස් වූ දළ සහිත සුදු ඇතෙකු චිත්‍රණය කොට ඇත. සමන් දෙවියන්ගේ වාහනය ලෙස සැළකෙන්නේ ඇත් රුව බැවින් මෙසේ රූප ගත කොට ඇත. බුදු පිළිමයට ඉදිරිපස බිත්ති තලයේ ද දොරටුවට දකුණු පසින් රාහුගේ රුවක් ඇඳ දක්වා තිබේ. මානව ශරීරයකින් හා පෙන ගොබය සහිත නාගයෙකුගේ හිසකින් යුක්ත ව එය චිත්‍රණය කොට ඇත. නාග හිස මත කේතුකාර වූ අලංකාර ඔටුන්නක් වේ. දෙඅත් වැලමිට ළඟින් නවා ළැම දෙසට ගෙන ඇත. කර වටා දිවෙන සළුවක් අල්ලා ගෙන සිටී. එම සළුපටේ දෙකෙළවර සිරුරෙ පිටුපසින් ශරීර දෙපස පහතට එල්ලෙමින් පවතී. උඩුකය අලංකාර ලෙස ආභරණයකින් සරසා තිබෙන අතර යටිකය විවිධ සැරසිලි මෝස්තර වලින් යුතු ජෝතියකින් සරසා ඇත.

## මෝස්තර

බුදුපිළිමයට වම්පසින් වූ බිත්තියෙහි ජනෙල් කවුළුවට පහතින් නාරිලතා මල් සැරසිල්ලකි. නාරිලතා මල්වල විශේෂත්වය වන්නේ මල්පෙති වලට මැදිව කාන්තාවකගේ උඩුකයක් නිරූපණය කර තිබීමයි. ලියවැලක් මෙන් විහිද ගිය අතු ඉති අතර නාරිලතා මල් 6 කි. සැරසිල්ලේ පසුබිම කළු පැහැයෙන් වර්ණ ගන්වා ඇත. මෙය ඉතා කලාත්මක සැරසිලි මෝස්තරයකි. ජනේලයට ඉහළින් ද ගුරුළු රූප දෙකක් සහිත මෝස්තරයකි. මේ හැරුණු විට දොරටුවේ බිත්ති දාරයේ හා ඇතුළු මාලයේ ජනෙල් කවුළුවේ බිත්ති දාරය මත අලංකාර පළාපෙති මෝස්තරයක් ඇඳ දක්වා ඇත.

## මකර තොරණ සහිත පිවිසුම් දොරටුව

පිට මාලයෙන් ඇතුළුමාලයට හෙවත් බුදුපිළිමය සහිත ගර්භයට ඇතුළුවීම සඳහා ඇති උස මීටර් 2.2 ක් හා පළල මීටර් 1.8 ක් වන දොරටුව හා සම්බන්ධ මෙම මකර තොරණ ඉදි වී ඇත. දොරටුව දෙපස ඉදිකළ සතරැස් කුළුණු මත වෙර දී බර උසුලන මානව රූප දෙකකි. ඔවුන් දොරටුව දෙපස ඉහළින් නිමවා ඇති මකරුන් දෙදෙනාගේ මුඛය විවරව තිබෙන අතර ඒ තුළ ඉහළින් ම තනා ඇති කිහිබි මුඛයෙන් විහිදෙන මල් වැලක් ගිලී පවතී. කිහිබි මුව දෙපස මකරුන්ගේ හිස මත චාමරධාරී පුද්ගලයන් දෙදෙනෙකු හා වාලධිය මත තවත් පුරුෂයන් දෙදෙනෙකු වශයෙන් සිව් දෙනෙකු නිරූපණය කොට ඇත. උළුවස්සේ ඉහළ හා මකරුන්

දෙදෙනාට මැදි වූ කොටසේ විහාර ගෘහයේ වැඩ නිමකළ දින වකවානු සටහන් කොට ඇත. ඒ අනුව "ශ්‍රී බුද්ධ වර්ෂයේ 2410 වැඩ නිමකළේ " යනුවෙන් සටහන් කොට ඇත. දොරටුව දෙපස බිත්ති දෙකෙළවර සීමාවේ මීටර් 3 ක් පමණ උස විය හැකි ආරක්ෂක රූප දෙකකි. එම රූපවලට කේතුකාකාර ශීර්ෂාවරණයක් තිබෙන අතර උඩුකය අලංකාර ආභරණවලින් සරසා ඇත. යටිකය ජෝතියකින් සරසා ඇත. මොවුන්ගේ එක් අතක් ඉගටියෙහි රුවාගෙන සිටින අතර අනෙක් අත ඉහළට ඔසවා මල් පොකුරක් දරමින් සිටී.මල් පොකුර දක්වා ඇත්තේ සිතුවම් ගත කිරීමෙනි. වෙනත් බොහෝ විහාරස්ථානවල මෙම ආරක්ෂකයින් අත කඩුවක් දරා සිටින නමුත් මෙහි ඒ වෙනුවට මල් පොකුරක් චිත්‍රණය කිරීම විශේෂ ලක්ෂණයකි. ඇතැම් විට බුදු මැදුරක දොරටුවෙහි ආයුධ දරන්නන් මූර්තිමත් කිරීමට මෙම නිර්මාණකරුවන් අකමැති වූවා විය හැකි ය. සමස්තයක් ලෙෂ ගත් කල මෙම මකර තොරණ විහාර ගෘහයට මනා ආලෝකයක් ලබා දෙයි. දැනට යම් තරමකින් හානියට පත් ව ඇති මෙ මකර තොරණ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කොට ඇත.

## ඇතුළුමාලයේ පිට බිත්තිවල සිතුවම්

ඇතුළුමාලයේ පිට බිත්ති මුහුණත්වලින් ඉදිරි බිත්තිය මකර තොරණ සහිත දොරටුවෙන් පිරී ඇත. මේ අනුව ඉතිරි බිත්ති මුහුණත 3 හි පමණක් සිතුවම් දැකගත හැකි වේ. බෞද්ධ සම්ප්‍රදායට අනුව දකුණු අංශයෙන් පෙති පිළිම ආදිය ප්‍රදක්ෂිණා කරන බැවින් මෙහි සිතුවම් ආරම්භ කොට ඇත්තේ ද එම සම්ප්‍රදායට අනුව ය.මෙම සිතුවම් අතර සූවිසි විවරණය, සිදුහත් බෝසතුන්ගේ උපතේ සිට බුද්ධත්වය දක්වා සිදුවීම් හා මාර පරාජය විශේෂ කොට සිතුවමට නංවා ඇත. සූවිසි විවරණය දක්වන සිතුවම් පෙළ නිරිත දිග බිත්තියේ ඉහළම තීරුවෙන් ආරම්භ කොට වයඹ හා ඊසාන යන බිත්ති 3 පුරා විහිදුවා ඇත. පළමු පේළියෙන් අවසන් නොවන සූවිසි විවරණයේ ඉතිරි කොටස් ආපස්සට දෙවන පේළියේ සිට ඊසාන හා වයඹ බිත්තිවල චිත්‍රණය කොට ඇත. එතැන් සිට ඉදිරියට නිරිත දිග බිත්ති තලයේ දෙවන පේළියෙහි චිත්‍රණය කරනු ලබන්නේ සිද්ධාර්ථ චරිතයයි. එක් එක් ජවනිකාවක් සුදු රේඛාවකින් වෙන් කරමින් ඉදිරියට ගලා යන අයුරින් කථා වස්තුව නිරූපණය වේ. ඒ ඒ ජවනිකාවල පසුබිම් වර්ණය කළු හා රතු වශයෙන් මාරුවෙන් මාරුවට යොා ඇත. විහාර ගෘහය තුල චිත්‍ර වලින් නිරූපිත සිද්ධීන් අක්ෂර පේළි යොදා නම් කර තිබුණද පිට මාලයේ චිත්‍ර එසේ නම් කොට නැත. එබැවින් කල්පනාවෙන් බලා ඒ ඒ අවස්ථා නිරූපනයන් හඳුනාගත යුතුව ඇත. ඒ අනුව පළමුවෙන් සිදුහත් කුමාර චරිතයේ සිතුවම් පෙළ ආරම්භ කොට ඇත්තේ මහාමායා දේවිය දරු ප්‍රසූතිය සඳහා දෙව්දහ පුරයට ගමන් කරන සිද්ධියකි. මාලිගයෙන් නික්මෙන කුමරිය කොඩි අතින් ගත් හා තම්මැට බෙර වයන්නන්ගේ පෙරහැරකින් ඉදිරියට ගමන් කරමින් සිටී. දෙවැනි ජවනිකාවේදී ඇයට ආයුධ රැගත් පිරිසක් රැකවරණය සලසයි. ඇතැම් විට ඔවුන් ලුම්බිණි උයනේ රාජකීය ආරක්ෂකයන් වීමටද පුළුවන. එහිම එක් ගසක් මුල සේවිකාවක් දණින් වැටී නිකටට අත තබාගෙන වැළපීමක් හෝ විශ්මිතව බලා සිටීමක් පෙන්නුම් කරයි. මෙම සේවිකාව හා රාජකීය පිරිස වළකා මග අවුරා ගෙන ඉදිරියෙන් දෙව්වරු දෙදෙනෙක් සිටිති. එම ජවනිකාවෙන් අනතුරුව ඇත්තේ සිදුහත් උපතයි. එහි

මහාමායාව ගවුමකට සමාන දිගු යටිකය ඇඳුමකින් හා උඩුකය කර පළල් බෝරිච්චි හැට්ටයකින් සැරසී වේල් එකකට සමාන දුහුල් වස්ත්‍රයක් හිසෙහි ලා ඒ මත ඔටුන්නක් පැළඳ ඇය නැමී ගිය සල්ගසෙහි අත්තක් දෑතින්ම අල්ලාගෙන ඉදිරිය බලා සිටී. ඇගේ වම් පසින් දෙදෙනෙකු හා දකුණු පසින් දෙදෙනෙකු වශයෙන් වලාකුළු මත සිටගත් සතර වරම් දෙව්වරු බිසවගේ යටිකය කොටස වැසෙන සේ තිරයක් අල්වාගෙන සිටිමිනි. මෙහි විශේෂත්වය වන්නේ වෙනත් කිසිදු කාන්තාවක හෝ පුරුෂයකු එම දරු ප්‍රසූති අවස්ථාවට සම්බන්ධ නොවීමයි. ඊළඟ ජවනිකාවෙහි කුමරු සත් පියුමක් මත නැග හිදී. එහි මල් සියල්ල එකිනෙක මත පිපී තිබෙන අතර ඒ මත්තෙහි කුමරුවා සිටගෙන සිටී. යටිකය වස්ත්‍රයකින් වසා ඇත. දෑත පහත හෙළා පසෙකට හැරී සිටී. කුමරුවාට ඉදිරියෙන් අලංකාර හිස් පැළඳුමකින් යුත් දෙව් කෙනෙක් සිටගෙන කුමරුවාට රැකවරණය සලසන ආකාරයක් වේ. මෙම දෙවිරුව සක්දෙවියන්ගේ යැයි සිතිය හැකිය. එම බිත්ති තලයේ දෙවන තීරුවෙහි නිරූපිත සිද්ධි දාමය ඉන් කෙළවර වන හෙයින් එතැන් සිට ඉතිරි කතා පුවත් එහිම 3 වන තීරුවේ සිට නැවත ආපස්සට චිත්‍රණය කර ඇත. ඒ අනවු එහි පළමු ජවනිකාවෙන් සිද්ධාර්ථ කුමරු කාලදේවල තවුසාට දැක්වීම නිරූපණය වේ. කාලදේවලගේ නළල් තල්‍ය මත පා රැඳීම හා සිදුහත් කුමරුට දණ නමා වදිමින් සිටී. අනතුරුව අනුපිළිවෙලින් සිදුහත් හා යශෝධරාවගේ විවාහය, එම යුවල මාළිගාවක සුවසේ කල් හැරීම, සුද්ධෝදන හා සිදුහත්ගේ විශේෂ සාකච්ඡාවක් අනතුරුව ඇති සිතුවම් වලින් නිරූපණය වේ. සිදුහත් ගිහිගෙයි රඳවා ගැනීමේ යටි අරමුණු ඇතිව පියා සිදුහත් සමග කිසියම් සාකච්ඡාවක නිරත වනවා විය හැකිය. බිත්ති තලයේ එම සිතුවම් තීරුව කෙළවර කොට ඇත්තේ කුමරුවා සඳහා යෙදූ ආරක්ෂකයෙකුගෙනි. අනතුරුව එතැන් සිට ඊළඟ බිත්ති තලයේ තුන්වැනි තීරුවේ එම කතා පුවත තවදුරටත් ඉදිරියට නිරූපණය කරයි. ඒ අනුව එහි කුමරු උයන් කෙළි සඳහා පිටත් වීම අනුපිළිවෙලින් මහල්ලෙක්, ලෙඩෙක්, මළමිනියක් හා ශ්‍රමණයෙක් වශයෙන් සතර පෙර නිමිති දකී. එය ඉතිරි සිදුවීම් එම බිත්තියේම 4 වන තීරුවෙහි සිට ආපස්සට සිතුවම් කළ ආකාරය පෙනෙතත් එම සිද්ධි කවර ඒවා දැයි හඳුනාගත නොහැකි තරමට මැකී ගොසිනි. බුද්ධත්වය දක්වා ඇති විශේෂ සිදුවීම් එහි චිත්‍රණය කොට තිබෙන්නට ඇතැයි සිතිමට පුළුවන. ඊසාන දිග බිත්තියේ පහළ සෙ.මී. 120 ක් පමණ තිරුවෙහි සවිස්තරාත්මක ලෙස මාර පරාජය නිරූපණය කොට ඇත. චිත්‍ර තීරුවේ මැද බෝරුකක් මුල වැඩ හිදින බුදුන්වහන්සේගේ දෙපස මාර සේනාව වේ. බුදුන්වහන්සේගේ වම් පසින් ඇතුපිට නැගී වසවර්තී මාරයා වේ. ඔහු පසුපස අවි මෝරාගත් මාර පිරිස සිටිති. ඔවුන් තීරු 3ක නිරූපිතය. බියකරු විරූපී මුහුණු වලින් මාර සේනාව නිරූපණය වේ. ඒ අතර කොටි, වලස්, අශ්ව, ගව, ගුරුළු ආදී මුහුණු හඳුනාගත හැකිය. බුදුරුවට ඉහළින් සතරවරම් දෙව්වරු අහසේ නමස්කාර කරමින් සිටිති. බුද්ධ රූපයට දකුණු පසින් පැරද යන මාර පිරිස චිත්‍රණය කර ඇත. ඔවුන් එකිනෙකා කා කොටා ගනිමින් පලා යන ආකාරයක් දිස්වේ. මෙම චිත්‍රයද බෙහෙවින් විනාශයට ලක්ව පවතී. සමස්තයක් ලෙස ගත් කල ඇතුළු මාලයේ චිත්‍රවලට වඩා පිට මාලයේ චිත්‍රවලට සිදුවී ඇති හානිය ඩැඩි ය. වහලයේ ජල කාන්දු වලින් ජනෙල් දොරවල් වලින් එන හිරිකිඩ හා අව්රශ්මියත් මේ සඳහා බලපෑම් ඇති කර ඇති බවක් පෙනී යයි. විහාර ගෘහයේ ඇතුළු මාලයේ සිතුවම් වඩා දක්ෂ ශිල්පියෙකු විසින් කර ඇති බවක් පෙනෙන අතර පිට බිත්ති තලය දෙවන අවස්ථාවක වෙනත් ශිල්පියෙකු විසින් කරන්නට ඇතැයි සිතීමට පුළුවන.

සිතුවම් ඇඳ ඇත්තේ කැටගලින් බඳින ලද බිත්තියෙහි යොදන ලද හුණු කපරාරුවක් මතය. මෙහි පැහැදිලිව බදාම ස්ථර දෙකක් යොදා ඇති බව පෙනේ. යොදාගත් වර්ණ ඒ ඒ ශිල්පීන් පාරම්පරිකව සකසා ගත් ඒවා බව සිතිය හැකිය.

මෙම විහාරයේ ප්‍රතිමා හෝ චිත්‍ර නිර්මාණය කළ ශිල්පීන් කවරෙකු දැයි දැන ගැනිමට කිසිදු සාක්ෂියක් අනාවරණය නොවූවත් ඔවුන් මහනුවර චිත්‍ර ශෛලිය අනුගමනය කළ පහතරට චිත්‍ර පරපුරකට අයත් වූවන් බව ට කිසිදු සැකයක් නැත. කලා විචාරකයන්ගේ ප්‍රමාණවත් අවධානයකට තවමත් ලක් නොවූ බුලත්සිංහල සිරි දේවමිත්තාරාමයේ හෙවත් බුලත්සිංහල මහ පන්සලේ බිතුසිතුවම් ආරක්ෂා කර ගනිමින් වටිනා සංස්කෘතික උරුමයක් ලෙසින් අනාගත ලෝකයට උරුම කර දීමේ වගකීම අප සැමගේ අද දිනයේ වගකීම යැයි අවසන් වශයෙන් සටහන් කළ යුතුව ඇත.